## 75 – හිරු උදා වැලා

හිරු උදා වැලා
නොයන තුරු බැසා
සමිඳුන් නම පසස ගොසින් වනව් බබුළුවා
ආලේලූයියා ආලේලූයියා

පසස සිටිව් සමිඳුන් මෙහෙකරුවනේ
පසස සිටිව් නම හිමි පා සඳුන්ගේ
හිමිපාණන් නමට දැනුත් නිති දිනේ
ගරු බුහුමන් සෙත් ආසිරි ලැබෙන්නේ

අදිපතියෝ වෙති සමිඳෝ මුළු ලොවේ
එතුමෝ වෙති මහිමෙන් මහා උතුමාණෝ
අප දෙව් සමිඳුන් සමාන කවුරුදෝ
ඉහල තැන්හි අසුන් අරා සිටින්නෝ

ඉහළ පහළ දෙලොව ඇසැ'ර බලන්නෝ
පහත වැටී ඉන්නන් යළි නගන්නෝ
කසල ගොඩින් දිළිඳුන් ඇදැ දමන්නෝ
රජ කුමරුන් ඇසරෙහි උන් තබන්නෝ